# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2022.07.21 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2022 ජුනි මාසයේ දී සියයට 58.9ක් වශයෙන් වාර්තා විය

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 මැයි මාසයේ පැවති සියයට 45.3හි සිට 2022 ජුනි මාසයේ දී සියයට 58.9ක් දක්වා ඉහළ ගියේය. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය මෙලෙස ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ මාසික ඉහළ යෑම් හේතු විය. ඒ අනුව, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 මැයි මාසයේ පැවති සියයට 58.0හි සිට 2022 ජුනි මාසයේ දී සියයට 75.8 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 මැයි මාසයේ පැවති සියයට 34.2හි සිට 2022 ජුනි මාසයේ දී සියයට 43.6 දක්වා ඉහළ ගියේය.

| උද්ධමනය | මැයි 2022 | ජුනි 2022 |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 208.7 | 231.5 |
| මාසික වෙනස (%) | 9.7 | 10.9 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 45.3 | 58.9 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 16.3 | 20.8 |
| **මූලික** | | |
| දර්ශක අගය | 197.9 | 215.9 |
| මාසික වෙනස (%) | 8.6 | 9.1 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 37.7 | 49.3 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 13.0 | 16.8 |

**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)**




2022 ජුනි මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 10.91ක් ලෙස වාර්තා වූ අතර, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් පිළිවෙළින්, සියයට 7.25කින් සහ සියයට 3.66කින් ඉහළ යෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, ආහාර කාණ්ඩය තුළ, සහල්, එළවළු, නැවුම් මත්ස්‍ය, සීනි, කිරිපිටි සහ කරවල මිල ගණන් ඉහළ ගියේය. තවද, ආහාර නොවන කාණ්ඩය තුළ 2022 ජුනි මාසයේ දී, ප්‍රවාහන (පෙට්‍රල්, ඩීසල් සහ බස් ගාස්තු), ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ සහ ගෘහ ඒකක නඩත්තුව, හා ආපනශාලා සහ හෝටල් යන උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් ඉහළ ගියේය.

**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




තවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 මැයි මාසයේ පැවති සියයට 16.3හි සිට 2022 ජුනි මාසයේ දී සියයට 20.8 දක්වා ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 මැයි මාසයේ පැවති සියයට 37.7හි සිට 2022 ජුනි මාසයේ දී සියයට 49.3 දක්වා ඉහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 මැයි මාසයේ පැවති සියයට 13.0හි සිට 2022 ජුනි මාසයේ දී සියයට 16.8 දක්වා ඉහළ ගියේය.

---

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් ශ්‍රී ලංකාවේ සියලුම පළාත්වල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

### උප කාණ්ඩ අනුව ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය
### (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) |
| 2021 | ජූනි | 145.7 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 4.1 | 5.4 | 4.4 |
| | ජූලි | 146.6 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 4.4 | 5.4 | 4.4 |
| | අගෝස්තු | 147.1 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 4.7 | 5.5 | 4.4 |
| | සැප්තැම්බර් | 147.5 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 4.8 | 5.5 | 4.4 |
| | ඔක්තෝබර් | 150.6 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 7.2 | 5.7 | 4.6 |
| | නොවැම්බර් | 155.3 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 8.8 | 6.2 | 5.0 |
| | දෙසැම්බර් | 161.0 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 10.8 | 7.0 | 5.5 |
| 2022 | ජනවාරි | 166.0 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 12.9 | 8.1 | 6.2 |
| | පෙබරවාරි | 167.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 14.1 | 9.3 | 7.1 |
| | මාර්තු | 172.7 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 17.3 | 10.6 | 8.2 |
| | අප්‍රේල් | 190.3 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 27.9 | 13.0 | 10.2 |
| | මැයි | 208.7 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 37.7 | 16.3 | 13.0 |
| | ජූනි | 231.5 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 49.3 | 20.8 | 16.8 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව